**හික්කඩුව නගර සභාව - 2023**

**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හික්කඩුව නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක් වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට හික්කඩුව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරිත්‍යාග ලෙස සභාවට ලද රු.600,000 ක් වටිනා බුට්ස් ජෝඩු 300 ක් හා පාරිභෝගික ද්‍රව්‍ය තොගවලට අයත් රු.58,404 ක් වූ තොග ගිණුම් ගතකර නොතිබුණි. | පරිත්‍යාග ලැබීම් ගිණුම් වල ඇතුළත් කර නොමැති බව. | පරිත්‍යාග ලැබීම් නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | ගෙවිය යුතු කර්මාන්ත ගිණුමේ ශේෂය රු.158,431 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි. | වරද නිවැරදි කිරීම සඳහා කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 04 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු. 9,049,803 ක වෙනසක් විය. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| දකුණු පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ 2010 දෙසැම්බර් 27 දිනැති දපපා/පපාකො/2010/01 චක්‍රලේඛය | | | | |
| (i) | 01 වන වගන්තිය | සභාව සතු සතිපොළ කඩ කාමර අවුරුදු 17 තිස්සේ ටෙන්ඩර් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී සති පොළ ටෙන්ඩර් කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කළ යුතුය. |
| (ii) | 05 වන වගන්තිය | හික්කඩුව නගර සභාවට අයත් කඩ කාමර 146 න් කඩ කාමර 45 ක ගිවිසුම් කාලය අවසන් වී තිබුණ ද, ඒවා යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. | නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව ගිවිසුම් යාවත්කාලීන කළ යුතුය. |
| (iii) | 06 වන වගන්තිය | 2012 වර්ෂයෙන් පසුව හික්කඩුව පොදු වෙළඳපොල කඩ කාමර 63 හි සහ හික්කඩුව මාළු කඩ 12 හි තක්සේරුව සිදුකර නොතිබුණි. | නව තක්සේරුව 2024 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන බව. | චක්‍රලේඛ ප්‍රකාරව නියමිත කාලය තුළ තක්සේරුව යාවත්කාලීන කළ යුතුය. |

### 1.7.2 අධිකාරි බලය නොලත් ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේදී ලේකම්වරයා විසින් කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් රහිතව දිනකට නිවස හා කාර්යාලය අතර ගමන් වාර 04 ක් සඳහා සභාවේ වාහනය භාවිතා කර තිබුණු අතර එහි ඉන්ධන වෙනුවෙන් රු.352,847 ක් ගෙවීම් කර තිබුණි. | තනතුරට අදාළ වරප්‍රසාද භුක්ති විඳිය හැකි බව. | පිරිවැය අවම වන පරිදි වාහන භාවිතා කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.32,920,984 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,964,982 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 25,269,759 | 36,545,992 | 39,460,140 | 39,403,532 | 21,176,683 | 21,729,523 | 26,538,285 | 42,317,680 |
| කුලී | 12,197,400 | 7,733,555 | 10,715,402 | 1,325,979 | 6,033,080 | 6,870,525 | 6,823,862 | 4,307,826 |
| බලපත්‍ර ගාස්තු | 524,300 | 554,810 | 555,610 | 47,555 | 935,000 | 565,375 | 565,375 | 48,355 |
| වෙනත් ආදායම් | 8,385,000 | 8,961,407 | 8,961,407 | - | 6,776,000 | 4,002,879 | 4,002,879 | - |
| | 46,376,459 | 53,795,764 | 59,692,559 | 40,777,066 | 34,920,763 | 33,168,302 | 37,930,401 | 46,673,861 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භයට මුළු හිඟ ආදායම රු.46,673,861 ක් වූ අතර, වර්ෂය අවසානයට එය රු.40,777,066 ක් විය. | ඉදිරියේදී ආදායම් රැස් කිරීම ඉහල නැංවීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. |
| (ආ) | සභාවේ පැවති වරිපනම් බදු ලේඛනවල හා පරිගණක මෘදුකාංග අනුව හිඟ වරිපනම් බදු ශේෂය අතර රු.4,129,276 ක වෙනසක් පැවතුණි. | ශේෂය නිවැරදි කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | වෙනස්කම් හඳුනාගෙන කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2021,2022 හා 2023 වර්ෂවලදී වෙළඳ බලපත්‍ර ලබා නොගත් සංචාරක මණ්ඩලයේ අනුමත හෝටල් පිළිවෙලින් 88,76 හා 83 ක් සම්බන්ධයෙන් නගර සභා ආඥා පනතේ 165. අ(4) වගන්තිය යටතේ නිතීමය කටයුතු සිදුකර නොතිබුණි. | 2023 වර්ෂයට අදාළව හෝටල් 62 කින් 0.3% ගාස්තුව අය කර ගැනීමට හැකි වූ අතර, එම මුදල රු.11,271,644 ක් බව. | නගර සභා ආඥා පනත අනුව කටයුතු කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හික්කඩුව නගර සභා බල ප්‍රදේශය තුල කසළ එකතු කිරීමේ කටයුතු සිදුකළයුතු බැවින් නගර සභා ආඥා පනතේ 157 වගන්තිය ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා පිළියෙල කර 157(9) වගන්තිය ප්‍රකාරව කසළ බද්දක් අය කිරීමට කටයුතු කළහැකි වුවත්, එසේ සභාව කටයුතු කර නොතිබුණි. | කසළ ගාස්තුව අය කර ගැනීම සඳහා අදාළ මිල ගණන් ගැසට් කිරීම සඳහා වන කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව. | නගර සභා ආඥා පනත ප්‍රකාරව කසළ බදු අය කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වර්ෂ 17 ක කාලයක සිට පැවති වටිනාකම රු.4,880,000 ක් වූ වාහන 03 ක් සභාව නමින් ලියාපදිංචි කර නොතිබුණි. තවද හික්කඩුව නගර සභා ගරාජයේ ගාල් කර, දිරාගොස් තිබූ ජල බවුසරයේ වැසිය පිළිබඳ අයිතිය තහවුරු කිරීමේ ලේඛන සභාව සතුව නොතිබුණි. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වන බව. | සභාව සතු වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) වසර 02 ත් වර්ෂ 08 ත් අතර කාලය තුළ භාවිතයෙන් ඉවත් කර තිබුණු පිරිවැය රු.2,215,000 ක් වූ වාහන හා යන්ත්‍රෝපකරණ 02 ක් සහ වටිනාකම සඳහන් නොවූ වාහන හා යන්ත්‍රෝපකරණ 04 ක් අබලන් වීම නිසා අපහරණය කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය පරිදි ඉදිරි කටයුතු සිදු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව අපහරණ කටයුතු කඩිනමින් සිදුකළ යුතුය. |
| (ඇ) සභාව සතු වාහන 03 ක් හා යන්ත්‍රෝපකරණ 01 ක් මාස 06 ත් වසර 06 ත් අතර කාලයක සිට අළුත්වැඩියා කිරීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | ඉංජිනේරු වාර්තා ලබාගෙන අළුත්වැඩියා කටයුතු සිදු කරන බව. | අළුත්වැඩියා කටයුතු කඩිනමින් සිදු කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හික්කඩුව නගර සභාව සතු භාවිතයට ගත හැකි වටිනාකම රු.9,180,000 ක් වූ වාහන 03 ක් වසර 02 ත් වසර 16 ත් අතර කාලයක සිට නිශ්කාර්යව පැවතුණි. | ගලි බවුසරය වෙනත් ආයතනයක් සමඟ හුවමාරු කර ගැනීමටත්, කෘ කැබ් රථය අළුත්වැඩියා කිරීමටත්, ජල බවුසරය පළාත් පාලන යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශ මත සුදුසු ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කරන බව. | නිශ්කාර්යව පවතින වත්කම් ඵලදායීව යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | නගර සභාව සතු ඉඩම් 36 ක් හා අක්කර 03 රූඩ් 03 පර්චස් 31.86 ක් පමණ වූ ඉඩම් 14 ක් සභාව නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට අදාළ ලිපි ලේඛන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යොමු කර ඇති බව. | සභාව සතු වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ සේවය කර විශ්‍රාම ගිය, ස්ථාන මාරු වූ හා සේවය අත්හිට වූ නිලධාරීන් 18 දෙනෙකුගෙන් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.478,541 ක ණය ශේෂයන් අයකර ගෙන නොතිබුණි. | අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |